السنّة النبوية وعلومها
www.sunnah.global

අල්ලාහ්ගේ දූතයාණන්ගේ (සල්ලල්ලාහු අලය්හි වසල්ලම්) ප්‍රාර්ථනා අතරින් එතුමා අධිකව කළ ප්‍රාර්ථනාව වූයේ, رَبَّنَا آتِنَا فِي الدُّنْيَا حَسَنَةً، وَفِي الْآخِرَةِ حَسَنَةً وَقِنَا عَذَابَ النَّارِ (අහෝ පරමාධිපතියාණනි! මෙලොව යහපත ද මතුලොවෙහි යහපත ද අපට පිරිනමනු මැනව. නිරයේ ගින්නේ දඬුවමින් අප ආරක්ෂා කරනු මැනව) යන්නයි

අනස් (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: අල්ලාහ්ගේ දූතයාණන්ගේ (සල්ලල්ලාහු අලය්හි වසල්ලම්) ප්‍රාර්ථනා අතරින් එතුමා අධිකව කළ ප්‍රාර්ථනාව වූයේ, رَبَّنَا آتِنَا فِي الدُّنْيَا حَسَنَةً، وَفِي الْآخِرَةِ حَسَنَةً وَقِنَا عَذَابَ النَّارِ (අහෝ පරමාධිපතියාණනි! මෙලොව යහපත ද මතුලොවෙහි යහපත ද අපට පිරිනමනු මැනව. නිරයේ ගින්නේ දඬුවමින් අප ආරක්ෂා කරනු මැනව) යන්නයි.

[صحيح] [متفق عليه]

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ ප්‍රාර්ථනා ගොනුවකින් අධික ලෙස ප්‍රාර්ථනා කරන්නෙකු වූහ. ඒවා අතරින්: "අල්ලාහුම්ම රබ්බනා ආතිනා ෆිද් දුන්යා හසනතන් වෆිල් ආහිඃරති හසනතන් වකිනා අදාබන්නාර්" (අහෝ පරමාධිපතියාණනි! මෙලොව යහපත ද මතුලොවෙහි යහපත ද අපට පිරිනමනු මැනව. නිරයේ ගින්නේ දඬුවමින් අප ආරක්ෂා කරනු මැනව) මෙලොව යහපත යන්නෙහි, අනුමත සමෘද්ධිමත් රසවත් පෝෂණය, දැහැමි බිරිය , නෙතට සිසිල ගෙන දෙන දරුවන්, සැනසුම, ප්‍රයෝජනවත් දැනුම, ධාර්මික ක්‍රියාව හා එවැනි ප්‍රිය මනාප හා අනුමත වෙනත් පැතුම් ද ඇතුළත් වේ. එමෙන්ම මතුලොව යහපත යන්නෙහි, මිනීවලෙහි නවාතැනෙහි හා අපා ගින්නේ දඬුවමින් ආරක්ෂාව, අල්ලාහ්ගේ තෘප්තිය ලැබීම, සදා සුවපහසුකම් තුළින් සාර්ථකත්වය සහ මහාකාරුණික පරමාධිපතියාණන්ගේ සමීපත්වය යනාදී කරුණු එහි ඇතුළත් වේ .

https://sunnah.global/hadeeth/si/show/5502

النجاة الخيرية
ALNAJAT CHARITY
لجنة الدعوة الإلكترونية
EDC E-Da'wah Committee